1.පාඩම හෝ ඒකකය- **සර්පිනාවේ ව්‍යුහය විවිධත්වය හා යාන්ත්‍රණය.**

2.නිපුණතාවය 2.0 -වාදනයේ මූලික හැකියා වර්ධනය කර ගනියි.

3.නිපුණතා මට්ටම 2.1 - වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

4.පෙර ඉගෙනුම් අවස්ථා/ශිෂ්‍යා කළ යුතු කාර්යයන් :

- ❖ ඔබට සර්පිනාව පිළිබඳ අධ්‍යයනය කිරීමට නම් ඒ පිළිබඳ කෙටි හැඳින්වීමක් අවශ්‍යයි.

**<u>හැඳින්වීම</u>**

**<u>සර්පිනාව</u>**

සර්පිනා වාද්‍ය භාණ්ඩය ලෝකයේ සියලුම භාණ්ඩ අතරින් ප්‍රමුඛස්ථානයක් ගන්නා වාද්‍ය භාණ්ඩයකි.සෑම සංගීතඥයෙකුම තම පරිශීලනය සඳහා සර්පිනාවක් භාවිත කිරීම සුලබ ලක්ෂණයකි.ලංකාවේ පැරණි ග්‍රැමෆෝන් ගීත සඳහා සර්පිනාව බහුලව යොදා ගෙන ඇත.පැරණි නූර්ති නාඩගම්,ටීටර්,බජව් සඳහා වාදනය කළ එකම සංගීත භාණ්ඩය ලෙසද සර්පිනාව හැඳින්වීම නිවැරදිය.සර්පිනාව අපරදිග සිට පෙරදිගට සංක්‍රමණය වූ සංගීත භාණ්ඩයකි.සංගීතය ඉගෙන ගන්නා සිසුවෙකුට සර්පිනාව පරිහරණය කරන ක්‍රම ශිල්ප,පරිහරණය කිරීමට පෙර එය කළ යුතු ආකාරය,එහි ක්‍රියාකාරිත්වය,සර්පිනාව පරිහරණය අවසානයේ නැවත එය යථා තත්ත්වයට පත් කිරීම. ආදී කරුණු පිළිබඳ දැන ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිතය.

- ❖ දැන් ඔබ 9 ශ්‍රේණියේ දෙවන වාරයට නියමිත සර්පිනාවේ ව්‍යුහය විවිධත්වය හා යාන්ත්‍රණය පිළිබඳ ඉතා පැහැදිලිව ඉගෙන ගැනීමට පහත සඳහන් පොත්පත්,Web Site , LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක පහත link ඔස්සේ නරඹන්න.සර්පිනාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය ලබා ගන්න.

- e-තක්සලාව : -

- e-නැණපියස :
  1. 9 පෙරදිග සංගීතය: සංගීත භාණ්ඩ හඳුනාගනිමු - සර්පිනාව (enenapiyasa.lk) -සංගීත ආචාර්ය සුනිමල් ජයතිලක මහතා ර/නිවි/රඹුක ම.වි.
  2. 9 පෙරදිග සංගීතය: සර්පිනාව හා එහි ව්‍යුහය (enenapiyasa.lk) - සංගීත ආචාර්ය සංජය වසන්ත ර/නිවි/අයගම ශ්‍රී රාහුල ම.වි.
- Youtube :
  1. https://youtu.be/Y3FioDRdNXE -සර්පිනාව හා එහි ව්‍යුහය-සංජය වසන්ත මහතා
  2. https://youtu.be/bbRzLrZOwO8 -රවීන්ද්‍ර රංගොඩගේ මහතා
  3. https://youtu.be/IX5yhRsAPCI -සංගීතා රත්නායක මිය
  4. https://youtu.be/DqjkPYHwmYk - තක්ෂිලා ජයකොඩි මිය
  5. https://youtu.be/EvabJ3aEi8Q - tuition.lk

❖ එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා පහත සඳහන් කියවීම් පත්‍රිකාව තුළ ඇතුළත් කරුණු ආධාරයෙන් මෙම පාඩම අවබෝධ කර ගන්න.ඒ සඳහා පාසලේ සංගීත විෂය භාර ගුරු මහතා ගේ මහත්මිය ගේ සහාය ලබා ගන්න.

## කියවීම් පත්‍රිකාව

බාහිර පෙනුම අනුව සර්පිනාව සරල පෙනුම හතරැස් පෙට්ටියක ස්වරූපයක් ගනියි.දැව වර්ග යොදා ගෙන ඇත් අතර අවශ්‍යතාව පරිදි ලෝහ කොටස් ද යොදා සර්පිනාව නිපදවා ඇත.හතරැස් ලී පෙට්ටියක් බඳු සර්පිනාව මැදින් දෙකට බෙදා වෙන් කොට ඇත.එම බෙදීම වෙන් කොට ඇත්තේ උඩ තට්ටුව හා යට තට්ටුව වශයෙනි.යට තට්ටුවට පිරෙන වාතය යට තට්ටුවට ගැනීම සඳහා මැද ලෑල්ලේ සිදුරු 6 ක් හෝ 8 ක් ඇත.එම ලෑල්ල මතු පිට නැවත කොටස් දෙකකට හෝ තුනකට බෙදා ඇත.නළා කාණ්ඩ අනුව එම කොටස් ගණන වෙනස් වේ.සිදුරු විවෘත කිරීම හෝ වැසීම සඳහා කම්බි කූරක් අග හතරැස් ලී පතුරු කැබල්ලක් රඳවා තිබේ.එය ව්‍යවහාරික බසින් ස්ටොපර්ස් නමින් හඳුන්වයි.එය තල්ලු කිරීමෙන් සුළං සිදුර වැසීමද ඇදීමෙන් සුළං සිදුර විවෘත වීමද, සිදුවේ.පහළ ස්වරයේ සිට ඉහළ ස්වරය දක්වා නළා 36 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සර්පිනාවේ එසවිය හැකි පහළ මැද ලෑල්ලට සවි කොට තිබේ.

සර්පිනාව සඳහා සුළං නිපදවෙන්නේ බැලෝව මඟිනි.එය තරමක් ඝන හාර්ඩ්බෝඩ් හා තුනී ලෙදර් සමින් නිමවා ඇත.මෙවැනි බැලෝ දෙකක් සාමාන්‍යයෙන් සර්පිනාවක පිහිටා ඇත.සර්පිනා වර්ග කිරීමේ දී බැලෝව ද විශේෂත්වයක් උසුලයි.

<u>සර්පිනා වර්ග</u>

- සිංගල් රීඩ්,ඩබල් රීඩ්,ත්‍රී සෙට්,ඔටෝ මැටික්,ස්කේල් චේන්ජර්
- හැන්ඩ් බැලෝ සර්පිනාව
- ෆුට් බැලෝ සර්පිනාව
- සයිඩ් බැලෝ,එකෝඩියන් බැලෝ සර්පිනාව

<u>සර්පිනාවේ ක්‍රියාකාරිත්වය</u>

බැලෝ එක එහා මෙහා කිරීමෙන් සර්පිනාවේ ඇතුළත කුහරයට වාතය පිරේ.ස්ටොපර්ස් එළියට ඇදීමෙන් යට තට්ටුවේ සිට උඩ තට්ටුවට වාතය ගමන් කිරීම සිදුවේ. යතුරු එබීමෙන් යතුරේ කෙළවර එසවෙන අතර එතැන පිහිටා ඇති සිදුරුවලින් වාතය පිටතට ගමන් කරයි.එම මාර්ගය තුළ පිහිටා ඇති නළා සුළඟ වැදීමෙන් කම්පනය වන අතර එයින් නාදයක් නොහොත් නියමිත ස්වරය නිපදවේ.

<u>සර්පිනා වාදන ශිල්ප ක්‍රම</u>

හැන්ඩ් බැලෝ සර්පිනා තනි අතින් ද,ෆුට් බැලෝ සර්පිනා දෑතින්ද වාදනය කෙරේ. හැන්ඩ් බැලෝ සඳහා දකුණත භාවිත කළ අතර පැරණි ශිල්පීහු බොහෝ දෙනෙක් වමත ද භාවිත කළෝය.

<u>සර්පිනාවේ භාවිතය</u>

ඉන්දීය ගසල් ගායනයේ ප්‍රධානතම වාද්‍ය භාණ්ඩයකි.ශාස්ත්‍රීය රාගධාරී වාදන සර්පිනාවෙන් ඉදිරිපත් කෙරේ.නූර්ති සංගීතයේ ද ප්‍රධාන වාද්‍ය භාණ්ඩයකි.වත්මන් ''පැදුරු සාජ්ජ'' හා වෙනත් සංගීත වාදන වලදී ද සර්පිනාව බහුලව භාවිත වේ.

<u>සර්පිනාව භාවිතයේ දී එය ගුණාත්මකව හා ආරක්ෂාකාරීව භාවිතය සඳහා</u>

- බැලෝ එක ලොක් කිරීමේ දී යතුරු ඔබමින් පිරී ඇති සුළං පිටතට විසිරෙන පරිදි ලොක් කිරීමට සැලකිලිමත් වීම.
- ස්ටොපර්ස් නැවත ඇතුළට යොමු කිරීම.උඩ ලී ආවරණය යථා පරිදි ස්ථාන ගත කිරීම.

- ශ්‍රැති ස්වරය පවත්වා ගැනීම සඳහා යතුරු සම්බන්ධ ටෙන්ෂන් කම්බි නැවීම හෝ දිග හැරීම නොකිරීම.
- අත්‍යවශ්‍යම කාරණයක දී හැර උඩ ලී ආවරණය ඉවත් නොකිරීම.



බැලෝ එක



ස්ටොපර්ස්



නලා සෙට්

ස්ප්‍රින්





ඇතුළත පෙට්ටියේ වා කවුලු



බැලෝ වා කවුලු

❖ අතිරේක පොත්/සඟරා :

1.අතිරේක කියවීම් පොත- පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය
2.සංගීත අධ්‍යයනය-ගුණපාල විතානගේ මහතා
3. පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය- ජානක බණ්ඩාර ජයලත් මහතා

5.මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

- සර්පිනාවේ ස්වරූපය පැහැදිලි කරයි.
- සර්පිනාවේ විවිධතාවන් පිළිබඳ අවබෝධයක් ලබයි.
- සර්පිනාවේ භාවිත ශිල්ප ක්‍රම පිළිබඳ ව සොයා බලයි.

6.ඇගයීම්/තක්සේරුකරණ ක්‍රමවේද හා ආකෘති :

- ❖ ඔබ නැරඹූ සර්පිනා ඇතුළත් vedio පාඩම් ඇසුරින් හෝ එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා ඉහත සඳහන් කියවීම් පත්‍රිකාව ආධාරයෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න. ඔබේ පාසලේ සංගීත ගුරුතමා/තුමියට පෙන්වා පිළිතුරු නිවැරදි දැ,යි තහවුරු කර ගන්න.

1.සර්පිනාව නම් සංගීත භාණ්ඩය හඳුන්වන තවත් නමක් ලියන්න.
2.සර්පිනා වර්ග නම් කරන්න.
3.සර්පිනාවක රූප සටයනක් ඇඳ එහි කොටස් නම් කරන්න.
4.සර්පිනාවක් සංගීතය හදාරන ශිෂ්‍යයකුට වැදගත්වන්නේ ඇයි ? දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
5.සර්පිනාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.
5.ඔබ සර්පිනාවක් පරිහරණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් ලියන්න.

පාඩම සැකසුම : නිවිතිගල අධ්‍යාපන කලාපය

සෞන්දර්ය අංශය